**ශීර්ෂය - 112 - විදේශ කටයුතු අමාත්‍යාංශය**
**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**
**-----------------------------------------------**

**විගණන විෂය පථය**
**--------------------**

විදේශ කටයුතු අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 17 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.2 **ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**
**--------------------------------------------------------------------------------------**

විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන් වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළයෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැළසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.3 විගණන නිරීක්ෂණය
----------------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව විදේශ කටයුතු අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම මෙහි (අ) සිට (උ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.12 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) **ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
| --- | --- |
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| නිවාස ඉන්වෙන්ට්‍රි ලේඛනය | ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 8 වන වගන්තිය |
| නිවාස පොරොත්තු ලේඛනය | ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 4.3.4 වන වගන්තිය |

(ආ) **විගණන සාක්ෂි නොවීම**

විදේශ දූත මණ්ඩලවලට අයත් එකතුව රු.328,668,393 ක ඉදිකිරීම් කටයුතුද, විසර්ජන ගිණුමේ දක්වා තිබුණු වාහන 09 කට අදාලව එකතුව රු.3,777,948 ක අලාභ හානි සහ සේවකයින් 05 කට අදාල රු.24,494,445 ක සේවක වන්දි ගෙවීම්වලට සම්බන්ධ ලිපිගොනු ඉදිරිපත් නොවීම නිසා එම ගනුදෙනු පිළිබඳව විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**(ඇ) විගණන විමසුම්වලට පිළිතුරු දීම**

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 02 කට 2014 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.58,765,372 ක් විය.

**(ඈ) විසර්ජන ගිණුම්**

**(i) මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.10,140,337,250 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු.10,005,451,601 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.134,885,649 ක් හෙවත් සියයට 1.3 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2013 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 7,718,370,950 | 7,702,141,747 | 16,229,203 | 0.2 |
| මූලධන | 2,421,966,300 | 2,303,309,854 | 118,656,446 | 4.9 |
| එකතුව | 10,140,337,250 | 10,005,451,601 | 134,885,649 | 1.3 |

**(ii) අයවැය විචලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ**.**

- වැය විෂයයන් 03 ක් සඳහා සළසා තිබුණු රු.3,350,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.
- වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 61 සිට සියයට 85 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඉ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 11201 | 30,000,000 | 16,863,247 | 18,000,000 | 24,333,895 | 125,000,000 | 92,199,198 |

මෙ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විෂය අංක 11201 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.3,411,683 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**(ඊ) අග්‍රිම ගිණුම්**

අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂ එකතුව රු.905,745,224 ක් විය. විස්තර පහත දැක්වේ.

| අග්‍රිම ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| 7002/0000/00/0035/0008/000 | 63,350,921 |
| 7002/0000/00/0035/0009/000 | 32,271,945 |
| 7002/0000/00/0035/0010/000 | 675,170,151 |
| 7002/000/00/0035/0011/000 | (463,557,480) |
| 7002/0000/00/0035/0012/000 | 101,950,473 |
| 7002/0000/00/0035/0013/000 | 496,559,214 |
| එකතුව | 905,745,224 |

මෙ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2014 අප්‍රේල් 30 දින වන විට අමාත්‍යාංශය පියවා නොතිබුණු අග්‍රිම ශේෂ එකතුව රු.891,116,748 ක් වී තිබුණි.

(ii) අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 වන දිනට අග්‍රිම ගිණුම්වල ශේෂයන් එදිනට නිරවුල් නොවූ අත්තිකාරම් ශේෂයන් හා විදේශ දූත මණ්ඩලවල මුදල් ශේෂයන්ද ඇතුළත්ව රු.177,766,484 ක නොගැලපීමක් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| | | **වටිනාකම** |
|---|---|---|
| | | ------------- |
| | | **රු.** |
| අමාත්‍යාංශයේ පොත්වල දැක්වෙන අග්‍රිම ශේෂය | | 905,745,224 |
| නොපියවූ අත්තිකාරම් | 345,013,347 | |
| දූත මණ්ඩලවල අවසාන මුදල් ශේෂය | 382,965,393 | |
| | ---------------- | |
| අමාත්‍යාංශයේ තිබිය යුතු අග්‍රිම ශේෂය | | 727,978,740 |
| | | --------------- |
| **වෙනස** | | **177,766,484** |
| | | ======== |

(iii) 2013 දෙසැම්බර් 31 දිනට විදේශ දූත මණ්ඩලවල නොපියවූ අත්තිකාරම් ශේෂය රු.333,055,195 ක් වූ අතර, එයින් වසර 05 කට වැඩි නොපියවූ අත්තිකාරම් ශේෂය රු.61,855,517 ක් විය.

(iv) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්ය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළයුතු වුවත්, චෙන්නායි මහ කොමසාරිස් කාර්යාලය විසින් අවස්ථා 03 කදී ලබාගෙන තිබුණු අතුරු අග්‍රිම කාර්ය නිමවී දින 81 ක ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි.

(උ) **පොදු තැන්පත් ගිණුම**

අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු.1,441,991,311 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2013 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | රු. |
| 6000/0000/00/0006/0071/000 | 35,857,444 |
| 6000/0000/00/0015/0025/000 | 1,406,133,867 |
| එකතුව | 1,441,991,311 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වර්ෂ 02 ක් ඉක්ම වූ රු.17,688,403 ක් වූ තැන්පතු 09 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii) අංක 6000/0000/00/006/0071/000 දරන අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුමේ විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ගනුදෙනු ද සටහන් කර තිබුණි. 2011 වර්ෂයෙන් පසුව එම ගිණුම ක්‍රියාත්මක කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂය අවසානයට එම ගිණුමේ ශේෂය වූ රු.35,857,443 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) අංක 6000/0000/00/0015/0025/000 දරන අමාත්‍යාංශයේ හා දූත මණ්ඩලවල පොදු තැන්පත් ගිණුමේ 2013 ජනවාරි 01 දිනට ශේෂය රු.631,080,693 ක් වූ නමුත්, 2013 විසර්ජන ගිණුමේ එම ශේෂය රු.873,869,504 ක් ලෙසට දක්වා තිබීම හේතුවෙන් රු.242,788,911 ක වෙනසක් නිරීක්ෂණය විය.

**1.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**1.4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**1.5 වත්කම් කළමනාකරණය**

**1.5.1 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) " පොදු රාජ්‍ය මණ්ඩල සමුළුව සඳහා වන කාර්ය සාධන බලකා ලේකම් කාර්යාලය " ට අදාල 2013 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තා 2014 ඔක්තෝබර් 24 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2013 වර්ෂයේ රු.10,976,000 ක වටිනාකමකට පොදු රාජ්‍ය මණ්ඩල සමුළුව වෙනුවෙන් මිලදී ගන්නා ලද ලීබඩු CHOGM යැයි සඳහන්ව නිකුත් කර තිබූ අතර, 2014 ජනවාරි මාසය වන විටත් නැවත අමාත්‍යාංශය වෙත ලැබූ බවට සාක්ෂි නොතිබුණි.

(ඇ) පොදු රාජ්‍ය මණ්ඩල සමුළුව වෙනුවෙන් ධජ මිලදී ගැනීම සඳහා රු.2,741,600 ක් හා ලීබඩු මිලදී ගැනීම සඳහා රු.187,855 ක් ගෙවා තිබුණද එම භාණ්ඩ තොග ලේඛනවල ඇතුළත් කර නොතිබුණි.

**1.6 අනුකූල නොවීම**

**නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| (i) XIX පරිච්ඡේදයේ 5.2.1 වගන්තිය | -- | රජයේ නිවසක පදිංචිවීම වෙනුවෙන් විවාහක නිලධාරියෙකුගේ වැටුපෙන් සියයට 12 ½ ක් නිවාස කුලී වශයෙන් අයකළ යුතු වුවත්, 40 ඒ, 40 සී යන නිවාසවල පදිංචි නිලධාරීන්ගේ වැටුප් පත් අනුව එසේ අයකර නොතිබුණි. |
| (ii) XIX පරිච්ඡේදයේ 5.4 වගන්තිය | -- | රජයේ සේවයේ නියුතු වූ අඹුසැමි යුවලක් රජයේ නිවාසයක පදිංචි වී සිටින අවස්ථාවකදී වැඩි වැටුප් ලබන නිලධාරියාගෙන් සියයට 12 1/2 ක් සහ අඩු වැටුප් ලබන නිලධාරියාගෙන් සියයට 5 ක්ද අයකර ගත යුතු වුවත්, සමිට් නිවාස යෝජනා ක්‍රමයේ 40 බී, 03 ඩී, 05 සී සහ 117 වත්ත නිවාස යෝජනා ක්‍රමයේ සී/3/2, ඩී/4/1 සහ ඒ/3/2 යන නිවාසවල පදිංචි නිලධාරීන්ගේ කලත්‍රයා රජයේ රැකියාවක නියුතු නමුත් ඔවුන්ගෙන් ඉහත පරිදි අයකර තිබෙන බවට වූ සාක්ෂි අදාල ලිපිගොනුවේ නොතිබුණි. |
| (iii) XIX පරිච්ඡේදයේ 6 වගන්තිය | -- | රජයේ නිවසක් නිලධාරියකුට පදිංචිය සඳහා වෙන්කර දීමේදී එම රෙගුලාසියේ සඳහන් බදු කොන්දේසි ඇතුළත්ව |

| | | | |
|---|---|---|---|
| | | | පිළියෙල කරන ලද ගිවිසුමක් මත සැපයිය යුතු වුවත් එවැනි බඳු ගිවිසුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) | මුදල් රෙගුලාසි 104(4), 109(1), 113(4) | 326,852 | 2012 වර්ෂය දක්වා විසර්ජන ගිණුම්වල දිගින් දිගටම සඳහන්ව තිබූ අලාභ හානි පිළිබඳ අදාල රෙගුලාසි පරිදි අමාත්‍යාංශ ලේකම්ගේ අත්සනින් යුත් පරිපූර්ණ වාර්තාද ඉදිරිපත් නොකර, පොතෙන් අස්කිරීමේ නියෝග හා හිමිකම් පෑම් අත්හැර දැමීමේ නියෝගද නොමැතිව අලාභ හානි 06 ක් 2013 වර්ෂයේ විසර්ජන ගිණුමෙන් ඉවත් කර තිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි 104 හා 109 | 23,996,293 | විසර්ජන ගිණුමේ දක්වා තිබුණු විදේශයන්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල සිද්ධි 22 කට අදාල පාඩු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකර ඉදිරියට ගෙන එමින් පැවතුණි. |
| (iii) | මුදල් රෙගුලාසි 106 | 1,091,828 | විසර්ජන ගිණුමේ පාඩු හා හානි යටතේ දැක්වෙන අයථා පරිහරණ මුදල් ආපසු අයකර ගත නොහැකි අවස්ථාවලදී භාණ්ඩාගාරයෙන් පාඩු පූර්ණය කර නොගෙන දිගින් දිගටම ගිණුමේ ඉදිරියට ගෙන එමින් පැවතුණි. |

| | | | |
|---|---|---|---|
| (iv) | මුදල් රෙගුලාසි 109(1) හා 113(4) | 898,842 | විසර්ජන ගිණුමේ දක්වා තිබුණු අලාභයන් 07 කට අදාලව වර්ෂය තුළ පොතෙන් කපාහැරීම් සහ අයකර ගැනීම්වලට අදාල ලිපිගොනු විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

**-------------------------**

| | | |
|---|---|---|
| 2009 මැයි 04 දිනැති අංක 11/2009 දරන චක්‍රලේඛය | -- | යම් තනතුරකට වෙන්කරන ලද නිවාසයක් හැර අනිකුත් සියළුම නිවාසවල බදු කාලය වසර 05 ක් වුවත්, 2008 පෙබරවාරි 14 දින රජයේ නිවසක් පදිංචිව ලබා දී තිබුණු නිලධාරියෙකු වසර 06 ක කාලයක් ඉක්මවා පදිංචි වී සිටියත් උක්ත විධාන පරිදි කටයුතු කර නොතිබුණි. |

**1.7 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පෝලන්තයේ පිහිටි ශ්‍රී ලංකා වර්සෝ තානාපති කාර්යාලයේ බැංකු ගිණුම් පිළියෙල කිරීමේදී මුදල් පොතේ ශේෂය අනුව බැංකු සැසඳුම් පිළියෙල කර නොතිබුණි.

(ආ) ලොස්ඇන්ජලීස්හි ශ්‍රී ලංකා කොන්සියුලර් ජනරාල් කාර්යාලයෙන් සොරා ගන්නා ලද ඇමරිකා එක්සත් ජනපද ඩොලර් (USD) 1,583 ක මුදල පාඩු හා හානි ලෙස නොසළකා බැංකු සැසඳුමට ගලපා තිබූ අතර, බැංකොක්හි පිහිටි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ හඳුනා නොගත් බැර ශේෂය ටීඑච්බී (THB) 3,568 ක් විය.

(ඇ) ජර්මනියේ පිහිටි ශ්‍රී ලංකා ෆ්‍රැන්ක්ෆර්ට් කොන්සියුලර් ජනරාල් කාර්යාලයේ 2013 අගෝස්තු 06 දින එකතු වූ යූරෝ (EURO) 795 ක මුදල 2013 දෙසැම්බර් 31 දින වන විටත් උපලබ්ධි වී නොතිබුණි.

(ඇ) ප්‍රංශයේ පිහිටි පැරිස් දූත මණ්ඩලයට අදාලව 2006 වර්ෂයේ හඳුනා නොගත් සෘජු බැර කිරීම් යුරෝ (EURO) 49,373 ක් වී තිබුණි.

(ඉ) 2004 වර්ෂයේ සිට ශ්‍රී ලංකා දූත මණ්ඩල 03 කට අදාලව ඉදිරිපත් නොවූ චෙක්පත් සීඒඩී (CAD) 2,086 ක් හා යුරෝ (EURO) 11,525 ක් වී තිබුණි.

(ඊ) 2003 වර්ෂයේ සිට දූත මණ්ඩල 06 ක බැංකුව හා මුදල් පොත අතර නොගැලපීම් ආර්යූබී (RUB) 27,128 ක්, ඇමරිකානු ඩොලර් (USD) 4,228 ක්, පීඑල්එන් (PLN) 2,341 ක්, (ටීඑච්බී) THB 300,445 ක්, යුරෝ (EURO) 1,527 ක්, යූඑන්ඩී (UND) 7,209,311 හා ජීබීපී (GBP) 10,880 ක් වී තිබුණි.

(උ) 2006 වර්ෂයේ සිට ශ්‍රී ලංකා දූත මණ්ඩල 02 ක හඳුනා නොගත් සෘජු හර කිරීම් යුරෝ (EURO) 21,648 ක් වී තිබුණි.

(ඌ) 2002 වර්ෂයේ සිට ශ්‍රී ලංකා දූත මණ්ඩල 04 ක උපලබ්ධි නොවූ තැන්පතු ශේෂය ඇමරිකානු ඩොලර් (USD) 1,201, අයිඑන්ආර් (INR) 3,936 ක් හා යුරෝ (EURO) 34,210 ක් වී තිබුණි.

**1.8** **පාඩු හා හානි**

--------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ)** **වාර්තා නොකළ වාහන අනතුරු**

---------------------------------

විදේශ කටයුතු අමාත්‍යාංශයට අයත් වාහන අට (08) කට සිදුව තිබුණු අලාභ හානි පිළිබඳ විසර්ජන ගිණුමෙන් අනාවරණය කර නොතිබුණු අතර, එම අලාභ හානි පිළිබඳ මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව වගකීම් නිශ්චය කර අලාභ හානි අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මෙයින් වාහන 06 කට අදාලව ගණනය කළ අලාභයේ වටිනාකම රු.2,401,451 ක් වී තිබුණත් එම අලාභහානි සඳහා සිදු කර තිබුණු අළුත්වැඩියා වියදමෙන් කොටසක් රක්ෂණයෙන් ආවරණය කර ඉතිරිය රජයේ මුදලින් වැය කර තිබුණි.

**(ආ)** **පරීක්ෂණ නිමනොකළ අලාභ හානි**

------------------------------------

නියැදි විගණන පරීක්ෂණයේදී අනාවරණය වූ පරිදි විදේශ දූත මණ්ඩලවලට අයත් වාහන අනතුරු ගොනු අට (08) කට අදාලව ගණනය කර තිබුණු අලාභ රු.4,085,892 ක් වූ

අතර, මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පරීක්ෂණ වාර්තාවලට අනුව වගකීම් නිශ්චය කර අලාභ හානි අයකර ගැනීමට කටයුතු කිරීම දුර්වල මට්ටමක පැවතුණි.

1.9 **අනාර්ථික ගනුදෙනු**

---------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) අමාත්‍යාංශයට අයත් බී 20 දරන රජයේ නිවාසයේ සවිකිරීම් සඳහා කේඩීඒ 75 ධාරිතාවයෙන් යුත් විදුලි ජනක යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් රු.2,997,340 ක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබුණි. අමාත්‍යාංශය විසින් ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියෙන් සැපයුම්කරුවකු තෝරා රු.3,481,632 කට විදුලි ජනක යන්ත්‍රය මිලදී ගෙන තිබුණි. මේ නිසා අමාත්‍යාංශයට රු.537,816 ක පාඩුවක් සිදු වී තිබුණි. කොන්ත්‍රාත් ගිවිසුමේ සඳහන් කොන්දේසි 03 ක් කඩ කර තිබුණු අතර, යන්ත්‍රය වෙනුවෙන් දක්වා තිබුණු වර්ෂ 03 ක වගකීම් කාලයද වසර 01 ක් දක්වා සැපයුම්කරු විසින් අඩුකර තිබුණි.

(ආ) විදේශ දූත මණ්ඩල සේවය අවසන් කර නැවත ශ්‍රී ලංකාවට පැමිණෙන නිලධාරීන්ගේ ගමන් මලු වරායෙන් නිදහස් කර ගැනීම පිළිබඳ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ගමන් මලු නිදහස් කර ගැනීමේදී නිරන්තරයෙන් දීර්ඝ කාලීන ප්‍රමාදයන් පවතින බව නිරීක්ෂණය වූ අතර, ඒ සඳහා දඩ වශයෙන් විශාල මුදලක් අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි. නියැදි විගණන පරීක්ෂාවට ලක්කරන ලද ගමන් මලු නිදහස් කර ගැනීම් 13 කට අදාලව සමාලෝචිත වර්ෂයේදී ප්‍රමාද ගාස්තු ලෙස රු.305,140 ක් ගෙවා තිබුණි. නිලධාරීන් නිසා ඇති වන ප්‍රමාද ගාස්තු නිලධාරීන්ගෙන් අයකර ගැනීමටත්, නිශ්කාෂණ නියෝජිතයාගේ අකාර්යක්ෂමතාව මත ඇති වන ප්‍රමාද ගාස්තු ඔවුනට ගෙවීම් කිරීමේදී අඩුකර ගැනීමටත් කටයුතු කර නොතිබුණි.

(ii) 2013 වර්ෂයේ රු.58,460,233 ක් ගමන් මලු ප්‍රවාහනය වෙනුවෙන් ශ්‍රී ලංකා නැව් සංස්ථාවට ගෙවා තිබූ අතර, නිලධාරීන් විදේශ දූත මණ්ඩල සේවය සඳහා පිටත්ව

යාමේදී රැගෙන යා හැකි ගමන් මලුවල ප්‍රමාණයන් සම්බන්ධයෙන් සීමාවන් දැක්වෙන චක්‍රලේඛයක් අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii) විදේශීය සේවා රාජකාරී කටයුතු අවසන් කර නැවත ශ්‍රී ලංකාවට පැමිණෙන නිලධාරීන්ගේ ගමන් මලු වරායෙන් නිදහස් කර ගැනීමේදී ඒ සම්බන්ධයෙන් සීමා හා ගාස්තුවලට අදාල විධිමත් ක්‍රමවේදයක් අමාත්‍යාංශය විසින් අනුගමනය කර නොතිබුණි. 2011 වර්ෂයේදී මේ පිළිබඳව විමසීමේදී 1968 ජුනි 16 දිනැති අංක X333Y දරන අමාත්‍යාංශ චක්‍රලේඛය යල්පැන තිබූ බැවින් ඒ වෙනුවට පැහැදිලි උපදෙස් අඩංගු චක්‍රලේඛයක් නිකුත් කිරීමට කටයුතු කරන බව පිළිතුරේ සඳහන් කර තිබුණත්, 2014 මාර්තු 31 දින වන විටද නව චක්‍රලේඛයක් නිකුත් කර නොතිබුණි.

## 1.10 කළමනාකරණ දුර්වලතා

-------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් විදේශ සේවා නිලධාරීන්ගේ නේවාසික පහසුකම් සළසාදීම සඳහා නිවාස සංවර්ධන අධිකාරියෙන් 2006 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා රු.මිලියන 70 ක් ගෙවා 117 වත්ත මිලදී ගෙන තිබුණි. එහි iv වන අදියර නිවාස යෝජනා ක්‍රමය යටතේ ඉදිකරන ලද නිවාස 20 හි අයිතිය තහවුරු කිරීම සඳහා වූ සින්නක්කර ඔප්පු නිවාස සංවර්ධන අධිකාරියෙන් ලබාගෙන නොතිබුණි.

(ආ) ක්‍රියාකාරී මට්ටමක නොපවතින ඉන්දියානු සාගර සමුද්‍රීය කටයුතු සහයෝගීතා ආයතනය වෙත විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් 2013 වර්ෂයේදී රු.3,825,000 ක් මුදාහැර තිබුණි.

## 1.11 මානව සම්පත් කළමනාකරණය

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 255 | 231 | 24 | -- |
| (ii) | තෘතියික මට්ටම | 07 | 05 | 02 | -- |
| (iii) | ද්විතියික මට්ටම | 359 | 279 | 80 | -- |
| (iv) | ප්‍රාථමික මට්ටම | 134 | 131 | 03 | -- |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | -- | 22 | -- | 22 |
| | එකතුව | 755 | 668 | 109 | 22 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 109 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.